# ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව

**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ (TRCSL) ඉහත තනතුරේ පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ II ශ්‍රේණියේ විදුලි සංදේශ නිලධාරී තනතුරට බඳවා ගැනීම - බාහිර

(1 [illegible]

- [illegible]
- තාක්ෂණික ප්‍රමිතීන් සහ අනුකූලතා පරීක්ෂණ පැවැත්වීම.
- නිරෝධන මැනීම , ක්ෂේත්‍ර ශක්තිය සහ බල මිනුම් පිළිබඳ කාර්යයන්හි නිරත වීම.
- තාක්ෂණික විමර්ශන පැවැත්වීම සහ වාර්තා ඉදිරිපත් කිරීම.
- තාක්ෂණික උපකරණ මිලදී ගැනීම සහ අනෙකුත් අදාළ ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහාය ලබා දීම.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ රාජකාරි සහ කාර්යයන් ඉටු කිරීමේදී කළමනාකාරිත්වයට සහාය වීම.

**(2) අවශ්‍ය අවම අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් :**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ පිළිගත් වෘත්තිය පුහුණු ආයතනයකින් පිරිනමනු ලබන NVQ 5 මට්ටමට හෝ SLQF 3 මට්ටමට නොඅඩු ඉලෙක්ට්‍රොනික හෝ විදුලි සංදේශ පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ කටුබැද්ද NDT ඩිප්ලෝමාව හෝ ඊට සමාන හෝ උසස් අධ්‍යාපන/වෘත්තිය සුදුසුකමක් ලබා තිබීම.

සහ

අධ්‍යාපන /වෘත්තීය සුදුසුකම් ලබාගැනීමෙන් පසු විදුලි සංදේශ ක්ෂේත්‍රයේ වසර 3ක සේවා පළපුරුද්ද ලබා තිබීම.

**(3) <u>බඳවා ගැනීමේ පටිපාටිය</u>**

ලිඛිත තරඟ විභාගයකින් අනතුරුව පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරා ගැනීම සිදු කෙරේ. තරඟ විභාගයේ සමස්ථ ලකුණු සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගත් කුසලතා අනුපිළිවෙල මත පමණක් පත්වීම් සිදු කෙරේ.

<u>ලිඛිත විභාගයේ විෂයයන්</u>

අ) භාෂා ප්‍රවීණතාවය සහ බුද්ධි පරීක්ෂණය - පැය 2 යි

ආ) තනතුරට අදාළ විෂය දැනුම - පැය 2 යි

බඳවා ගැනීමේ විභාගය සමත් වීම සඳහා, එක් එක් විෂය සඳහා ලබාදී ඇති ලකුණු වලින් අවම වශයෙන් 40%ක් සහ සමස්ත ලකුණු එකතුවෙන් අවම වශයෙන් 50%ක් ලබාගෙන තිබිය යුතුය.

**(4) වැටුප :-** TRC 5.2 -Rs. 105,101 (10x2112) -(10x2816) -(10x3519) -(10x4223) – 231,801. මෙම තනතුර සඳහා සියලුම නව පත්වීම් මෙම රැකියා කාණ්ඩයේ II ශ්‍රේණියට අදාළ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ලැබේ.

**(5) වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු.18-45 අතර විය යුතුය.

**(6) පොදු කොන්දේසි :**

- මෙය ස්ථිර පත්වීමක් වන අතර වසර 03 පරිවාස කාලයකට යටත් වේ.
- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව නියාමන අධිකාරියක් වන අතර , කොමිෂන් සභාවේ සේවයට බඳවා ගන්නා ඕිනෑම තැනැත්තකු විසින් ඔහුගේ / ඇයගේ කලත්‍රයා හෝ පවුලේ සාමාජිකයකු කොමිෂන් සභාවේ නියාමන පාලනයට යටත් වන ආයතනයක තනතුරකට පත් කිරීම හෝ රැකියාවක නිරත වීම උදෙසා සෘජුව හෝ වක්‍රව අනුබල දීම / දිරි ගැන්වීම / උපදෙස් දීම සිදු නොකළ යුතුය.
- බඳවා ගන්නා තනතුරු සංඛ්‍යාව , බඳවා ගැනීම කල්දැමීම/ අවලංගු කිරීම පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව (TRCSL) සතුවේ.
- අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් සලකා බලනු නොලැබේ.
- ඕිනෑම ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා බඳවා ගැනීමට නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

**(7) අයදුම් කිරීමේ ක්‍රමය**

1. අයදුම්පත ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය වන www.trc.gov.lk වෙතින් බාගත කරගත හැකිය..
2. නියමිත ආකෘතිය අනුව පිළියෙල නොකරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
3. අයදුම්පත් පැහැදිලි සහ කියවිය හැකි විය යුතු අතර, අවශ්‍යතා නොසපුරන අයදුම්පත් සලකා බලනු නොලැබේ.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත් අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහතිකවල පිටපත් සහ සේවා පළපුරුද්ද පිළිබඳ විස්තර සමඟ එවිය යුතුය.
5. සියලුම අයදුම්පත් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතිකවල පිටපත් සහිතව **2026.06.01 දින හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, අංක 276, ඇල්විටිගල මාවත, කොළඹ 08" යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ විදුලි සංදේශ නිලධාරී (II ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීම (බාහිර) -2026** යනුවෙන් සඳහන් කළ යුතුය.
6. අයදුම්පතෙහි ස්කෑන් කරන ලද පිටපතක් අදාළ අධ්‍යාපනික සහ වෘත්තීය සහතික සමඟ careers@trc.gov.lkවිද්‍යුත් තැපෑලට එවිය යුතුය. විද්‍යුත් තැපෑලෙහි මාතෘකාව "**විදුලි සංදේශ නිලධාරී (II ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීම (බාහිර) - 2026** විය යුතුය.
7. රාජ්‍ය ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.
8. අයදුම්පත් **2026.06.01** දින හෝ එදිනට පෙර ලැබෙන සේ ඉදිරිපත් කළ යුතුය.


**අධ්‍යක්ෂ ජනරාල්**<br>
**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව**<br>
**අංක 276**<br>
**ඇල්විටිගල මාවත**<br>
**කොළඹ 08**

විදුලි සංදේශ නිලධාරී (II ශ්‍රේණිය) තනතුර සඳහා අයදුම්පත්‍රය (බාහිර )

1. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසියෙන් ) :මහතා ./ මහත්මිය ./ මෙනවිය ……………………………………………………

2. සම්පූර්ණ නම ( ඉංග්‍රීසියෙන් ) : …………………………………………………………………………

3. සම්පූර්ණ නම ( සිංහලෙන් / දෙමළින්) :………………………………………………………………..

4. ලිපිනය : ………………………………………………………………………

5. උපන් දිනය :…………………….. 2026 . 05.25 දිනට වයස : ………………………….

6. දුරකථන අංකය .: ………………………

7. විද්‍යුත් තැපැල් ලිපිනය ……………………………………..

8. ජාතික හැඳුනුම්පත් අංකය : ……………………………………………..

9. ස්ත්‍රී/ පුරුෂ භාවය : ……………………………………………

10. අධ්‍යාපන සුදුසුකම් : ……………………………………………………………………

11.වෘත්තීය සුදුසුකම් : …………………………………………………………………

12.සේවා පළපුරුද්ද ……………………………………………………………………….

13. ඔබ රජයේ සේවයේ නියුක්ත නම්:

ආයතනය : ………………………………………………………

තනතුර : ………………………………………………………..

14. අමුණා ඇති සහතික පිටපත්

1 ………………………………………………………………………

2.……………………………………………………………………

3.……………………………………………………………………

4.……………………………………………………………………

15. අයදුම්කරුගේ ප්‍රකාශය

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මගේ දැනුම හා විශ්වාසය අනුව සත්‍ය සහ නිවැරදි බව මම ගෞරවයෙන් ප්‍රකාශ කරමි. මෙම අයදුම්පතේ කිසියම්

තොරතුරක් අසම්පූර්ණව හෝ වැරදි ලෙස ඉදිරිපත් කිරීමෙන් ඇතිවිය හැකි ඕනෑම ප්‍රතිඵලයක් සඳහා වගකීම භාර ගැනීමට මම එකඟ වෙමි. තවද, මෙම අයදුම්පතෙහි සඳහන් සියලු

කරුණු මාගේ දැනුම අනුව නිවැරදි බවද මම සහතික කරමි.

දිනය : ……………………… අයදුම්කරුගේ අත්සන : ……………………………………..

16. දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ සහතිකය (රජයේ ආයතනවල සේවය කරන අයදුම්කරුවන් සඳහා)

මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවය කරන …………………………………………………………… මහතා/මහත්මිය/ මෙනවිය ………………………………………… තනතුරේ සේවය කරමින් සිටින අතර, ඔහුගේ/ඇයගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහු/ඇයට එරෙහිව කිසිදු

විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවත්, අනාගතයේදී එවැනි ක්‍රියාමාර්ගක් ගනු ලබන බවට තීරණය කර නොමැති බවත් මම මෙයින් සහතික කරමි. තවද, ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය මෙම ආයතනයේ සේවයෙන් මුදාහැරිය හැකි / නොහැකි බව මෙයින් දැනුම් දෙමි.

දිනය : ………………………

නම : ..............................................................................................................................................

තනතුර : - ....................................................................................................................................

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව /ආයතනය : -…………………………………………………………………

නිල මුද්‍රාව :